සෞඛ්‍ය අමාත්‍යංශය                                                                                    අධ්‍යාපන අමාත්‍යංශය

**සෞඛ්‍ය අමාත්‍යංශයේ බෝනොවන රෝග ඒකකය හා අධ්‍යාපන අමාත්‍යංශය**
**එක්ව සංවිධානය කරනු ලබන බෝනොවන රෝග පිළිබඳ අන්තර් පාසලීය දැනුම මිනුම තරගය**

ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් අතර සෞඛ්‍යමත් නොවන ආහාර පරිභෝජනය, ක්‍රියාශීලී බවින් තොරවීම සහ තරබාරුව වැනි බෝනොවන රෝග පිළිබඳ අවධානම් සාධක බහුලවීම හේතුවෙන් හෘදයාබාධ, දියවැඩියාව,අධි රුධිර පීඩනය, පිළිකා සහ ආඝාතය වැනි බෝනොවන රෝග අනාගතයේදී බහුල විය හැකි බව වෛද්‍ය විශේෂඥයින්ගේ මතය වී ඇත. එබැවින්, බෝනොවන රෝග ඇතුළත්ව සෞඛ්‍යමත් ජීවන රටාව පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යංශය හා ඒකාබද්ධව දැනුම මිනුම තරඟයක් පැවැත්වීමට සෞඛ්‍ය අමාත්‍යංශයේ බෝනොවන රෝග ඒකකය තීරණය කොට ඇත.

**තරගය පවත්වන ආකාරය :**

ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පහත සඳහන් කොන්දේසි වලට යටත්ව කලාප, දිස්ත්‍රික් , පළාත් , අර්ධ අවසාන, අවසාන පූර්ව සහ අවසාන ලෙස වට හයකින් තරගය පවත්වනු ලැබේ.

**තරග කොන්දේසි :**

1. සෑම දිස්ත්‍රික්කයකම පවතින සියලුම රජයේ පාසල් වලට අයදුම් කල හැකි අතර, එක් පාසලකින් සිසුන් පස් දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ඉදිරිපත් කළ යුතුය.
2. සෑම පාසලකම 8 සහ 9 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන්ට මේ සඳහා සහභාගී විය හැකිය.
3. බෝනොවන රෝග ඇතුළත්ව සෞඛ්‍යමත් ජීවන රටාවක වැදගත්කම පිළිබඳ දැනුම පමණක් පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

ඒ සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර පිලිබඳව අවධානය යොමු කළ යුතුය.

| | |
|---|---|
| නිදන්ගත බෝනොවන රෝග **(Chronic NCD)** | හෘද රෝග සහ මොළය ආශ්‍රිත රෝග, නිදන්ගත ශ්වසන රෝග, දියවැඩියාව , අධි රුධිර පීඩනය, පිළිකා<br>අවධානම් සාධක - සෞඛ්‍යමත් නොවන ආහාර, ශාරිරික ක්‍රියාකාරකම්වල නොයෙදීම, තරබාරුව, දුම්කොළ සහ මධ්‍යසාර භාවිතය |
| නිදන්ගත නොවන බෝනොවන රෝග **(Acute NCD)** | හදිසි අනතුරු (මාර්ග අනතුරු සහ නිවසේදී සිදුවන අනතුරු) වැටීම්, දියේ ගිලීම්, පිළිස්සීම්, හුස්ම හිරවීම, සර්පයන් දෂ්ඨ කිරීම, සතුන්ගෙන් වන සපාකෑම්, විෂ වීම් වැනි අනතුරු සහ ප්‍රථමාධාර |
| වෙනත් බෝනොවන රෝග | මානසික රෝග, වකුගඩු රෝග සහ තැලසීමියාව |

**ජයග්‍රාහකයන් සඳහා වන ත්‍යාග සහ සහතික :**

1. **කලාප වටය :** ජයග්‍රහණය කරන සිසුන්ට සහතික පත් හිමි වන අතර සහභාගීත්‍යටද සහතිකයක් පිරිනැමේ.
2. **දිස්ත්‍රික්ක වටය:** කලාප වලින් වැඩිම ලකුණු ලබා ගන්නා දිස්ත්‍රික් කණ්ඩායම් 25ට එක් සිසුවෙකුට රුපියල් 2000.00 ක වවුචරයක් සහ සහතිකයක් හිමිවේ. සහභාගිත්‍යටද සහතිකයක් පිරිනැමේ.
3. **පළාත් වටය:** ජයග්‍රහණය කරන කණ්ඩායම් 09 සඳහා එක් සිසුවෙකුට රුපියල් 5,000.00ක් සහ සහතිකයක් බැගින් හිමිවේ. සහභාගිත්‍යටද සහතිකයක් පිරිනැමේ. ජයග්‍රහණය කරන පාසල් 09ට රුපියල් 50,000.00ක ත්‍යාගයක් බැගින් හිමිවේ..
4. **අර්ධ අවසාන වටය:** ජයග්‍රණය කරන කණ්ඩායම් 03 සඳහා එක් සිසුවෙකුට රුපියල් 10,000.00ක් සහ සහතිකයක් බැගින් හිමි වන අතර,. සහභාගිත්‍යටද සහතිකයක් පිරිනැමේ.
5. **අවසාන පූර්ව වටය :** ජයග්‍රණය කරන කණ්ඩායම් 02 සඳහා එක් සිසුවෙකුට රුපියල් 15,000.00ක් සහ සහතිකයක් බැගින් හිමි වන අතර,. සහභාගිත්‍යටද සහතිකයක් පිරිනැමේ.
6. **අවසාන වටය:** ජයග්‍රණය කරන කණ්ඩායම සඳහා එක් සිසුවෙකුට රුපියල් 20,000.00 සහ සහතිකයක් හිමි වන අතර, එම පාසලට රු.100,000.00ක ත්‍යාගයක් සහ කුසලානයක් හිමිවේ. අනු ශූරතාවය හිමි වන කණ්ඩායම සඳහා එක් සිසුවෙකුට රුපියල් 10,000.00ක් සහ සහතිකයක් හිමි වන අතර, එම පාසලට රු.75,000.00ක ත්‍යාගයක් සහ කුසලානයක් හිමිවේ.

තරගයට ඇතුල්වීම සඳහා පහත සඳහන් අයදුම් පත්‍රය පුරවා විදුහල්පති මගින් පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් එවිය යුතුය. එම අයදුම්පත් **interschoolquizncd@gmail.com** විද්‍යුත් ලිපිනයටද යොමු කල යුතුය.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝනොවන රෝග ඒකකය හා අධ්‍යාපන අමාත්‍යාංශය
**එක්ව සංවිධානය කරනු ලබන බෝනොවන රෝග පිළිබඳ අන්තර් පාඨශාලීය දැනුම මිනුම් තරගය**
**අයදුම් පත්‍රය**

1. **පළාත :**
2. **දිස්ත්‍රික්කය :**
3. **කලාපය:**
4. **පාසලේ නම :**

| අංකය | ශිෂ්‍යයාගේ / ශිෂ්‍යයාවගේ සම්පූර්ණ නම | ස්ත්‍රී / පුරුෂ | ශ්‍රේණිය | වයස |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය සහ නිවැරදි බව ප්‍රකාශ කරමි.

විදුහල්පතිගේ අත්සන :
නම:
නිල මුද්‍රාව :
දිනය :

**අයදුම් පත් එවිය යුතු ලිපිනය:** අධ්‍යක්ෂ, බෝනොවන රෝග ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය" , 385, බද්දේගම විමලවංශ නාහිමි මාවත, කොළඹ 10.

**තරගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2024.06.20 වේ.**

තරගය පිළිබඳ වැඩිදුර විස්තර 0112669599 හෝ 0724343270 යන දුරකථනවලින් හෝ interschoolquizncd@gmail.com විද්‍යුත් තැපැල මගින් විමසිය හැකිය. දෙමළ මාධ්‍යයෙන්ද එම කාර්යාල දුරකථනය හරහා වැඩිදුර විස්තර විමසිය හැකිය.

**වෛද්‍ය සමිද්ධි සමරකෝන්**
**අධ්‍යක්ෂ**
**බෝනොවන රෝග ඒකකය**